කාර්යසාධන වාර්තාව - 2021

செயலாற்றுகை அறிக்கை - 2021

Performance Report - 2021

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

சுதேச வைத்திய மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலை அபிவிருத்தி மற்றும் சமுதாய சுகாதார இரா ஜாங்க அமைச்சு

State Ministry of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development & Community Health

පටුන

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
1	**ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	
1.1	හැඳින්වීම	5
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	6
1.3	ප්‍රධාන කාර්යයන්	7 – 8
1.4	සංවිධාන සටහන	9
1.5	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන	10
1.6	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්	11
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	11
2	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	
2.1	විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය	12 – 21
2.2	ඉදිරි ඉලක්ක	22
2.3	අභියෝග	23
3	**වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	24
3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	25
3.4	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	26
3.5	මූල්‍ය ප්‍රකාශ සටහන්	27
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	27
3.7	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	27
3.8	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	27
3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	27
3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව	28 – 36
4	**කාර්ය සාධන දර්ශක**	
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	37
5	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	38
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	38
6	**මානව සම්පත් පැතිකඩ**	
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	39
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	39
6.3	මානව සම්පත් සංවර්ධනය	39 – 40
7	**අනුකූලතා වාර්තාව**	41 - 46

1 පරිච්ඡේදය

01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

අනාදිමත් කාලයක සිට පරිසරය පදනම් කර ගත් වෛද්‍ය ඥාණයක් හා වෛද්‍ය ක්‍රමයක් අප සතුව පැවති බවට ඓතිහාසික සාක්ෂි ඕනෑ තරම් ඇත. විදේශ ආක්‍රමණ සමඟ අප සතුව පැවති පාරම්පරික වෛද්‍ය ක්‍රම නොයෙක් තර්ජනයන්ට මුහුණ පෑවද දේශීය වෛද්‍ය විද්‍යාවේ ආශ්චර්ය හඳුනාගත් මෙරට පාලකයින් විසින් වරින් වර එය නංවාලීමට විවිධ පියවර ගෙන ඇත.

නිදහසින් පසුව 1949 අංක 49 දරණ ව්‍යවස්ථාව මඟින් ස්වදේශීය ආඥා පනත සංශෝධනය කිරීම, 1957 ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1961 අංක 31 දරණ ආයුර්වේද පනත සම්මත කර ගැනීම, 1980 වසරේ දේශීය වෛද්‍ය ප්‍රවර්ධනය සඳහා වූ නව අමාත්‍යාංශයක් පිහිටුවීම වැනි සංධිස්ථාන පසු කරමින් 1994 දී මෙය කැබිනට් අමාත්‍යාංශයක් දක්වා වැඩිදියුණු විය. එතැන් පටන් කැබිනට් අමාත්‍යවරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය 2015.01.18 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට පැවරුණු අතර 2015.09.21 දින සිට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නමින්ද, 2019.12.10 දින සිට සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය ලෙසද ක්‍රියාත්මක විය.

වසර දහස් ගණන් අතීතයකට විහිදුණු පාරම්පරික දැනුම සම්මිශ්‍රණය වූ පාරම්පරික වෙදකමත්, ආයුර්වේද, සිද්ධ, යුනානී හා හෝමියෝපති යනාදී විවිධ වෛද්‍ය ක්‍රම මත පදනම්ව දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය වී ඇත. ඒ අනුව දේශීය වෛද්‍ය ක්‍රමය තුළින් මනා සේවාවක් ලබාදෙමින් නිරෝගී ජනතාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව මෑත කාලීනව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී. එහිදී ආයුර්වේද දෙපාර්තමේන්තුව හා අනුබද්ධ ආයතන, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ඉටු කරන මෙහෙය ප්‍රශංසනීය වේ.

ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වූ රෝහල් පද්ධතිය වැඩිදියුණු කරමින්, රෝගී සත්කාර සේවාව කාර්යක්ෂම කිරීම සඳහා සුදුසු කාර්ය මණ්ඩල බඳවා ගැනීම හා පුහුණු කිරීමත්, වෛද්‍ය පර්යේෂණ වැඩිදියුණු කිරීම, ප්‍රජා සෞඛ්‍ය සේවාව පුළුල් කරමින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, ඖෂධ පැල වගාව හා සංරක්ෂණය සඳහා කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, ඊට අනුබද්ධ ආයතන සහ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ඒකාබද්ධව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

හෙළ වෙදකමින් සැමට සුව සෙත යන තේමා පාඨය මුල් කර ගනිමින් ප්‍රධාන ප්‍රමුඛතාවයන් 10ක් ඔස්සේ සුව ධරණී ඉදිරි දැක්මට අනුව මෙම අමාත්‍යාංශය වර්තමානයේ කටයුතු කරනු ලබයි. වර්තමානයේ පවතින කොවිඩ් 19 අභියෝගය හමුවේ වුවද දේශීය වෛද්‍ය කෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් සිදු කරමින් පවතින අතර සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ වෙමින් දේශීය වෙදකම ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කිරීම මඟින් ජාත්‍යන්තරයටද මෙම මහඟු වෙදකම ගෙනයාම සඳහා කටයුතු කරනු ලැබේ.

2021 වර්ෂයේදී වාර්ෂික අයවැයෙන් ලද ප්‍රතිපාදනයට අමතරව අතිරේක ප්‍රතිපාදන සලසා ගනිමින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීමට හැකිවූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

හෙළ වෙදකමින් සැමට සුවසෙත

මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම

1.3 ප්‍රධාන කාර්යයන්

ප්‍රතිපත්ති හා ප්‍රධාන අරමුණු

1. **අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් සාක්ෂාත් කරගත හැකි නීති රාමුවක් සහ ජාතික ප්‍රතිපත්තියක් තිබීම.**

   i. දේශීය වෛද්‍ය ක්‍රමය නඟා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.

   ii. කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් සහ දේශීය වෛද්‍ය ක්‍රමය සුරක්ෂිත කිරීමට පවතින නීති සඳහා සංශෝධන ගෙන ඒම.

   iii. දේශීය වෛද්‍ය ක්‍රම සුරක්ෂිත කිරීම සඳහා පවතින නීතිවලට අනුකූලව, රෙගුලාසි පැනවීම හා නව නීති ගෙන ඒම.

   iv. දැනට බලපවත්නා නීතිරීති වලට අනුව පිහිටවිය යුතු සභා/ මණ්ඩල ස්ථාපනය කිරීම සහ විධිමත් කිරීම.

2. **අත්‍යවශ්‍ය පහසුකම් සහිත ගුණාත්මක දේශීය වෛද්‍ය සේවාවක් ජනතාවට හිමි වීම.**

   i. නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සෞඛ්‍ය සේවයෙහි ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය පාලන පද්ධති අදාළ ආයතනවලට හඳුන්වා දීම හා පවතින පද්ධති සංවර්ධනය කිරීම.

   ii. වඩාත් සුරක්ෂිත දේශීය වෛද්‍ය සේවාවක් ලබා දීමට විධිමත් ලෙස නියාමනය කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.

   iii. ප්‍රතිකාර සේවා සඳහා ප්‍රවේශ වීමට අපහසු ප්‍රජාව සඳහා පහසුකම් සැලසීම.

   iv. ජනතා කේන්ද්‍රීය දේශීය වෛද්‍ය සේවාවක් සැලසීම.

   v. වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට සියළු ආයතනවල භෞතික සම්පත් සංවර්ධනය.

   vi. විශේෂිත රෝග සඳහා සහ නිවාරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම.

3. **අනාගත පරම්පරාව සඳහා දේශීය වෛද්‍ය ක්‍රම සුරක්ෂිතව සංරක්ෂණය වී තිබීම.**

   i. දැනුම සුරක්ෂිත කිරීමට අවශ්‍ය ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීම.

   ii. පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම සංරක්ෂණය කිරීම.

   iii. දේශීය වෛද්‍ය ක්‍රමය හා බැඳුණු සංස්කෘතික අංග සංරක්ෂණය කර ජනගත කිරීම.

   iv. වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති ඔසු ශාක හා පැළෑටි සංරක්ෂණය කිරීම.

   v. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලෙන අය සඳහා සමාජ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

4. **දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අවස්ථාවන් සහ දැනුවත් වීමේ අවස්ථාවන් පැවතීම.**

   i. පාසල් අධ්‍යාපනය තුළ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

   ii. උසස් අධ්‍යාපනය තුළ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

   iii. ගුණාත්මක දේශීය වෛද්‍ය සේවයක් ජනතාවට සැපයීම සඳහා ප්‍රශස්ත හා තිරසාර මානව සම්පතක් පවත්වා ගැනීම.

   iv. සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය දැනුම සමාජගත කිරීම.

5. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ තුළින් ක්ෂේත්‍රයේ ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු වීම.

i. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සඳහා වඩා වැඩි අවස්ථාවන් සළසා දීම හා දිරි ගැන්වීම.

ii. විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් නව ඖෂධ, චිකිත්සා පද්ධති හා නවීන දැනුම සමාජගත කිරීම.

iii. පර්යේෂණ අණාවරණ සුරක්ෂිත කිරීම.

6. දේශීය වෛද්‍ය ක්‍රම සඳහා ජාත්‍යන්තර ආකර්ෂණය ලැබීම.

i. දැනුවත් කිරීම හා අත්දැකීම් හුවමාරු අවස්ථාවන් සැලසීම තුළින් දේශීය වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර ප්‍රජාවට සමීප කරවීම.

ii. සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

iii. ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු දේශීය ඖෂධ නිෂ්පාදන විදේශ වෙළඳපොල වෙත ඇති ප්‍රවේශය ඉහළ නැංවීම.

iv. ක්ෂේත්‍රයේ ගුණාත්මක බව හා තිරසාර පැවැත්ම සඳහා ජාත්‍යන්තර සංවිධාන වල සහයෝගය ලබා ගැනීම.

7. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව නිෂ්පාදනය වී තිබීම.

i. "සුව ධරණී" හෙළ ඔසු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතිය දීප ව්‍යාප්තව තිරසාරව ක්‍රියාත්මක කිරීම.

ii. දේශීය ඖෂධ මෙරට සුලභ කිරීම.

iii. අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ගුණාත්මක දේශීය ඖෂධ නිෂ්පාදනයක් මෙරට තුළ බිහි කිරීම.

iv. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව දේශීය ඖෂධ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීම.

8. බෝවන හා බෝ නොවන රෝග පැකිරීම අවම මට්ටමක පැවතීම.

i. දේශීය වෛද්‍ය සංකල්ප භාවිතයෙන් බෝවන හා බෝ නොවන රෝග පැතිරීම වැළැක්වීම පිළිබඳ ප්‍රජාව තුළ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.

ii. දේශීය වෛද්‍ය ක්‍රමය මුල් කරගත් ජීවන දර්ශනය ප්‍රජාව තුළ ස්ථාපිත කිරීම.

9. වස විසෙන් තොර ආහාර පරිභෝජනය සියළු වයස් කාණ්ඩ අතර ප්‍රචලිත වීම.

i. ප්‍රජාව තුළ දේශීය වෛද්‍ය පෝෂණ සංකල්ප පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.

ii. වස විසෙන් තොර ආහාර පරිභෝජනය ජනගත කිරීම.

10. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලැබීම.

i. විදේශ විනිමය මෙරටින් බැහැරට ගලායාම අවම කිරීම.

ii. විදේශ විනිමය උපයා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

iii. ජනතාවගේ ආදායම් උත්පාදන මාර්ග ඉහළ නැංවීමට දායක වීම.

iv. ආයතනික ආදායම් උත්පාදන මාර්ග ඉහළ නැංවීමට දායකවීම

1.4 සංවිධාන සටහන


රාජ්‍ය අමාත්‍ය
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (සංවර්ධන)
විශේෂඥ වෛද්‍ය නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරී
ගණකාධිකාරී
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
පරිපාලන නිලධාරී
සංඛ්‍යාලේඛන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර
රියදුරු
කාර්යාල කාර්ය සහයක

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු - නැත

(අ) ව්‍යාපෘතියේ නම

(ආ) දායක නියෝජිතායතනය

(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම -රු.මි.

(ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව

2 පරිච්ඡේදය

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය

(1) කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය පාලනයට දේශීය වෛද්‍ය ක්‍රම මඟින් ඉහළ දායකත්වයක් ලබා දීම

කොවිඩ්-19 වසංගත තත්ත්වය රට තුළ ව්‍යාප්ත වීමත් සමඟ අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යය කොවිඩ් - 19 රෝග තත්ත්වය නිවාරණය හා පාලනය බවට පත් කර ගනිමින් ජනතාවට වඩාත් සමීප සේවාවක් ලබා දීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පහතින් දැක්වේ.

I. සුව ධරණී ප්‍රතිශක්තිකරණ වර්ධක පානය හඳුන්වා දීම

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥ සුදුසුකම් සහිත විද්වතුන්ගෙන් සමන්විත, කොවිඩ්-19 රෝග තත්ත්වය මැඩලීම පිළිබඳ දේශීය වෛද්‍ය ජාතික කමිටුවෙහි අනුමැතිය සහිතව හා ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි පූර්ණ අධීක්ෂණයට යටත්ව "සුව ධරණී" ප්‍රතිශක්තිකරණ වර්ධක පානය ජනතාව වෙත හඳුන්වා දෙන ලදී.

ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු විසින් රට පුරා නොමිලේ මෙම ඖෂධය බෙදා දුන් අතර අමාත්‍යාංශය මැදිහත් වීමෙන් සහනදායී මිලක් යටතේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා පෞද්ගලික දේශීය ඖෂධ නිෂ්පාදන සමාගම් 54ක් මඟින් පහසුවෙන් මෙම ඖෂධය ජනතාවට ලබා ගැනීම සඳහා අවස්ථාව සළසා දී ඇත.

II. කොවිඩ්-19 රෝගය සඳහා ආයුර්වේදයෙන් නේවාසික ප්‍රතිකාර

බටහිර හා ආයුර්වේද වෛද්‍ය ක්‍රම එකම ස්ථානයක රෝගීන් සඳහා භාවිතා කිරීමේ ක්‍රමවේදයක් ප්‍රථම වරට හඳුන්වා දීම සහ ඒ ඔස්සේ පර්යේෂණ කළ හැකි අවස්ථාවකට මඟ පෑදීම සෞඛ්‍ය ක්ෂේත්‍රය ලත් ජයග්‍රහණයකි.
ඒ අනුව කොවිඩ්-19 අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස ආයුර්වේද රෝහල් 16ක ඇදන් 1558කින් යුක්තව නේවාසික ප්‍රතිකාර ක්‍රියාත්මක විය. මේ යටතේ 2021 වර්ෂයේදී රෝගීන් 12,000 කට නේවාසික ප්‍රතිකාර ලබා දී ඇත.

III. කොවිඩ් -19 නිවෙස්ගත ප්‍රතිකාර සේවා

දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම යොදාගනිමින් නිවෙස්ගත කොවිඩ්-19 රෝගීන් 173,500කට අධික පිරිසක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

IV. කොවිඩ්-19 රෝග නිවාරණ සේවා

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු හා ඒකාබද්ධව සුවධරණී තොරතුරු සේවාව සම්බන්ධීකරණය කරමින් දිවයින පුරා ජනතාව දැනුවත් කිරීම හා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මඟින් දැනුවත් කිරීම, පාසල් ළමුන් සඳහා මාර්ගෝපදේශන විද්‍යුත් අත්පොත ප්‍රකාශයට පත් කිරීම, නිවෙස්ගත රෝගීන් සඳහා මාර්ගෝපදේශන ලබා දීම සිදු කර ඇත.

දේශීය වෛද්‍ය ක්‍රමයේ පවත්නා ප්‍රතිශක්තිකරණ ඖෂධ පුද්ගලයන් 3,700,000කට අධික ප්‍රමාණයකට ලබා දී ඇත. පළාත් මට්ටමින් ජංගම සායන 10,708ක් පවත්වා පුද්ගලයින් 127,100කට වෛද්‍ය හා උපදේශන සේවා ලබා දී ඇත. පෞද්ගලික ඖෂධ නිෂ්පාදන ආයතන 14ක් මඟින්ද ප්‍රතිශක්තිකරණ ඖෂධ පහසු මිලට ජනතාවට ලබා ගැනීම සඳහාද අවස්ථාව සලසා දී ඇත.

V. සුව ධරණී සුව සේවා හදිසි ඇමතුම් සේවය

කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය හමුවේ ආයුර්වේද ප්‍රතිකාර පිළිබඳ උනන්දුවක් දක්වන මහජනතාවට අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම ලබා දීම, අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිළිබඳ හා ඒ ආශ්‍රිත සේවාවන් ජනතාවට ක්ෂණිකව ලබා දීම මෙම සේවය මඟින් සිදු කරයි. මෙමඟින් සේවා ලබා ගත් සංඛ්‍යාව 14,952කට අධිකය.

VI. කොවිඩ් -19 සඳහා හෝමියෝපති ප්‍රතිකාර

විකල්ප වෛද්‍ය ක්‍රමයක් වන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මඟින් කොවිඩ්-19 රෝග නිවාරණය සඳහා ජනතාවට පහසුකම් සපයා ඇත.

VII. අධ්‍යාත්මික වැඩසටහන්

ආගමික හා සංස්කෘතික පසුබිම මුල් කර ගනිමින් රට තුළ පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වී තිබෙන රෝ බිය දුරුවී රටටත් ජනතාවටත් ආශිර්වාද පැතීම සඳහා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2021.06.22 සිට 2021.06.28 දක්වා අට දිශාවම ආවරණය වන පරිදි රතන සූත්‍ර සජ්ඣායනාවක් හා “සුඛී දීඝායුකෝ භව” ආශිර්වාද පිරිත් පිංකම් වැඩසටහන අනුරාධපුර රුන්වැලි සෑ පුදබිමේදී 2021.09.14 දින සිට 2021.09.20 දින දක්වා පැවැත්වුණි.

VIII. පශ්චාත් කොවිඩ් ප්‍රතිකාර ඒකක

කොවිඩ් -19 ආසාදිතයන් සුවවීමෙන් පසුව මුහුණ දෙන සෞඛ්‍ය හා මානසික ගැටළු වෙනුවෙන් ප්‍රතිකාර හා උපදේශන සේවා ලබාදීම සඳහා ප්‍රථම පශ්චාත් කොවිඩ් ප්‍රතිකාර ඒකකය 2021.09.30 වන දින ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල මූලික කරගනිමින් පිහිටවනු ලැබීය. එසේම සියළුම ආයුර්වේද රෝහල්වල පශ්චාත් කොවිඩ් ප්‍රතිකාර ඒකක ක්‍රියාත්මක කරවන ලදී.

IX. දේශීය වෙදකමේ අභිමානය - දොරින් දොරට සුව ධරණී ඖෂධ මංජුසාව

දේශීය ඖෂධ මඟින් කොවිඩ් -19 වසංගතය පාලනය කිරීම සඳහා ලබා දී ඇති ඉහළ දායකත්වය සහ ඒ පිළිබඳව ජනතාවගේ විශ්වාසය සැලකිල්ලට ගෙන කොවිඩ්-19 වසංගතයෙන් රටේ ජනතාව මුදා ගැනීම සඳහා දේශීය ඖෂධ ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාත්මක “දේශීය වෙදකමේ අභිමානය දොරින් දොරට” සුව ධරණී ඖෂධ මංජුසා ව්‍යාපෘතියේ පළමු අදියර බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී පවුල් 430,453කට බෙදා දීම ආරම්භ කර ඇති අතර ඖෂධ මංජුසා 128,954ක් බෙදා දී ඇත.

(2) බෝවන හා බෝ නොවන රෝග පැකිරීම අවම මට්ටමක පවත්වා ගැනීම හා වස විසෙන් තොර ආහාර පරිභෝජනය සියළු වයස් කාණ්ඩ අතර ප්‍රචලිත කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග.

I. වස විසෙන් තොර දේශීය ආහාර රටාවක් ජනතාව අතර ප්‍රචලිත කරමින් බෝ නොවන රෝග වළක්වා ගැනීම හා ආහාර සෞඛ්‍යාරක්ෂිතව අලෙවි කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 336ම ආවරණය වන පරිදි **පෝෂණ මන්දිර** ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වන විට පෝෂණ මන්දිර 35ක් ස්ථාපිත කර ඇත. වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන යටතේ වර්ෂයකට පෝෂණ මන්දිර 05ක් පමණ ස්ථාපිත කරන අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පෝෂණ මන්දිරයක් ස්ථාපිත කිරීම මෙම වැඩසටහන මඟින් ඉලක්ක කර ඇත. 2021 වසරේදී මිණිපේ, ගම්පහ, වත්තල, මහර හා දිවුලපිටිය යන ප්‍රදේශවල පෝෂණ මන්දිර ඉදිකර ජනතා සේවයට පත් කර ඇති අතර මේ සඳහා ඉදිරියේදී පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමටද සැලසුම් කෙරේ.

II. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ මරණවලින් විශාල ප්‍රමාණයකට හේතුව බෝ නොවන රෝගයි. මෙයට ප්‍රධාන කාරණය වන්නේ මිනිසා අපගේ සම්ප්‍රදායික දේශීය ආහාර රටාවෙන් ඈත්වී අධික ලෙස ක්ෂණික ආහාර භාවිතා කිරීමත් වැරදි විහරණ සහ අතෘප්තිකර මානසිකත්වය හේතුවෙන් ඇතිවන මානසික ආතතියයි. මෙම වැරදි දින චර්යා නිසා පුද්ගල ප්‍රතිශක්තිය සහ අධ්‍යාත්මයද පිරිහී බෝ නොවන රෝග වලට පහසුවෙන් ගොදුරු වේ. අද වන විට සෞඛ්‍ය හීන ජාතියක් බවට පත් වෙමින් යන අප ජාතිය යළි සෞඛ්‍ය සම්පන්න ජාතියක් බවට පත් කිරීමේ අරමුණින් අපගේ සම්ප්‍රදායික ජීවන රටාව යළි සමාජගත කිරීම සඳහා "සුව ධරණී සුව චර්යා" ජාතික වැඩසටහන ජනගත කර ඇත.

III. බෝවන හා බෝ නොවන රෝග වැළැක්වීම, වස විසෙන් තොර ආහාර ප්‍රචලිත කිරීම, "පුනර්ජීවනී" මත්ද්‍රව්‍ය නිවාරණ හා පුනුරුත්ථාපනය, ප්‍රතිකාර සේවා සඳහා ප්‍රවේශ වීමට අපහසු ප්‍රජාව සඳහා සත්කාරක සේවා සහ ළමා හා මාතෘ පෝෂණය යන තේමාවන් මූලික කරගනිමින් වැඩසටහන් ආරම්භ කර ඇත.

IV. අම්බලන්ගොඩ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම ආරණ්‍ය සේනාසනයෙන් ආරම්භ කළ කැපකරු වැඩසටහන යටතේ දීප ව්‍යාප්තව **සුව ධරණී සුව සේවා කැපකරු වැඩසටහන** ආරණ්‍ය සේනාසන 556ක, වැඩිහිටි නිවාස 320ක හා ආබාධිත නිවාස 96ක ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

V. වස විසෙන් තොර ආහාර පරිභෝජනය දිරි ගැන්වීම, බෝවන රෝග පාලනය හා බෝ නොවන රෝග වැළැක්වීම අරමුණු කරගනිමින් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනතාව, පාසල් සිසුන් හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

(3) පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සරල කිරීම

I. පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ක්ෂේත්‍රයේ නියැලී සිටින වෛද්‍යවරුන්ගෙන් ලැබූ පැමිණිලි හා යෝජනා සැළකිල්ලට ගෙන ඔවුන් අපහසුවට පත් නොවන ආකාරයට ලියාපදිංචි ක්‍රමවේදය සරල කොට ප්‍රාදේශීය මට්ටමට ගොස් ඔවුන් ලියාපදිංචි කිරීම 2021 වසරේ ජූලි මාසයේදී ආරම්භ කොට ගම්පහ, මහනුවර, නුවර එළිය, මාතලේ, ගාල්ල, මාතර, හම්බන්තොට, බදුල්ල, මොණරාගල, කොළඹ, කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ලියාපදිංචියට අයදුම් කර තිබූ වෛද්‍යවරුන් සඳහා එම ප්‍රදේශවලටම ගොස් සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ලැබූවන් ලියාපදිංචිය කිරීමට කටයුතු කර ඇත.

(4) දේශීය වෛද්‍ය ක්‍රමය ජනතාවට සමීප කරවීම.

I.පාරම්පරික වෛද්‍යවරුන්ගේ **ජාතික නාමාවලියක්** සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

II. සුවධරණී ජීවක සෙවණ ව්‍යාපෘතිය යටතේ පාරම්පරික වෛද්‍යවරුන් "ළ" තාක්ෂණය ඔස්සේ ජනතාවට සමීප කරවීම සඳහා **"අපේ වෙද මහත්තයා"** වෙබ් අඩවිය එළි දැක්වීම.

III. අමාත්‍යාංශයේ **නිල වෙබ් අඩවිය** හා **මුහුණු පොත** එළි දැක්වීම.

IV. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් දීප ව්‍යාප්තව සිදු කරනු ලබන වැඩසටහන් හා රෝගී සත්කාර සේවාවන් පිළිබඳ ජනතාවට තොරතුරු ලබාදීමට **"ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාව"** නමින් නිල මුහුණු පොත ක්‍රියාත්මත කිරීම.

(5) "සුව ධරණී" හෙළ ඔසු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතිය

දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා තීරුබදු සහනය යටතේ වාර්ෂිකව ඔසු අමුද්‍රව්‍ය ආනයනය සඳහා වැය වන විදේශ විනිමය අවම කර ගැනීම, දේශීය ඖෂධ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගොවී සහභාගීත්ව වාණිජ ඔසු වගාව මඟින් ග්‍රාමීය ජනතාවගේ ආදායම ඉහළ නැංවීමට, දේශීය ඖෂධ භාවිතයට ජනතාව හුරු කරවීමට, ඖෂධ නිෂ්පාදනයට ප්‍රමිතියෙන් යුතු ඔසු අමුද්‍රව්‍ය භාවිතය සහ වඳවීමේ තර්ජනයට ලක්වී ඇති ඖෂධ සංරක්ෂණය කිරීම සඳහා පෞද්ගලික අංශයේද දායකත්වය ලබා ගනිමින් සුව ධරණී හෙළ ඔසු සංවර්ධන සහ සංරක්ෂණ ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර ඒ තුළින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ගොවීන්ගේ සහභාගීත්වයෙන් පෞද්ගලික වතු සහ ගෙවතු ආශ්‍රිතව සුව ධරණී ඔසු ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් තීරුබදු සහනය යටතේ දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඔසු අමුද්‍රව්‍ය ආනයනය සඳහා වැයවන විදේශ විනිමය අඩුකර ගැනීම සහ ග්‍රාමීය ජනතාවගේ ආදායම් උත්පාදනය කිරීම.

II. ආයුර්වේද සංරක්ෂණ සභා, රාජ්‍ය ආයතන, පාසල්, පිරිවෙන්, විශ්ව විද්‍යාල සහ ගෙවතුවල ඔසු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් දේශීය ඖෂධ හඳුනා ගැනීම සහ එම ඖෂධ භාවිතය ජනතාව අතර ප්‍රචලිත කිරීම.

III. හරිතකී නගර ආශ්‍රිත ඔසු වන උද්‍යාන

මේ තුළින් තෝරා ගන්නා භූමිවල ඖෂධීය වටිනාකමක් ඇති සහ වාතය පිරිසිදු කරන පරිසර හිතකාමී ශාක, වැල් වර්ග හා යටි රෝපණ වගාවන් ස්ථාපනය කිරීමට යෝජිත අතර එතුළින් පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීමටත්, නගර අලංකරණයත් අරමුණු කරගෙන ඔසු වන උද්‍යාන ඇති කිරීම.

IV. ග්‍රාමීය ප්‍රජා සහභාගීත්වය ඇතිව මී පැණි සහ ඖෂධීය තෙල් නිෂ්පාදන ගම්මාන ඇති කිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම. ඔසු උයන්, පෞද්ගලික තවාන් හා ගෙවතු ආශ්‍රිතව ඖෂධ පැළ නිෂ්පාදනය.

මීට අමතරව දිගු කාලීන ව්‍යාපෘතියක් ලෙස පැළ දස ලක්ෂයක් අවුරුදු 03ක් ඇතුළත සිටුවා වඳවීමේ තර්ජනයට ලක්වී ඇති ඖෂධීය ශාක සංරක්ෂණය කිරීමට බලාපොරොත්තු වේ.

V. ඔසු අමුද්‍රව්‍ය මිලදී ගැනීම බිම් මට්ටමට

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන ඖෂධ මිලදී ගැනීමේ මධ්‍යස්ථානවලට අතිරේක වශයෙන් ගම් මට්ටමට ගොස් සෘජුවම ගොවියාගෙන් ඔසු මිලදී ගැනීමේ වැඩසටහනක් මෙම වසර තුළ ආරම්භ කර ඇත. ඒ අනුව දඹාන ආදීවාසි ගම්මානයට ගොස් ඔසු මිලදී ගැනීම මෙම වසරේදී සිදු කරනු ලැබීය.

(6) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අවස්ථාවන් සහ දැනුවත් කිරීමේ අවස්ථාවන් ඇති කිරීම.

I. ප්‍රකාශන එළි දැක්වීම

"සුව ධරණී" ත්‍රෛමාසික ජාත්‍යන්තර සඟරාව

ලොව පුරා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම උදෙසා පාරම්පරික හෙළ වෙදකම හා ආයුර්වේදීය වෙදකම ඇතුළුව දේශීය වෛද්‍ය ක්‍රමයන් අප රටට සීමා නොවී ජාත්‍යන්තරය කරා රැගෙන ගොස් ලොව පුරා ප්‍රචලිත කර ඔවුන්ගේ ආකර්ෂණය හා අවධානය ලබා ගැනීම අපගේ සුවිශේෂි අරමුණකි. ඒ සඳහා"සුව ධරණී" ත්‍රෛමාසික ජාත්‍යන්තර සඟරාව අරලියගහ මන්දිර පරිශ්‍රයේදී එළි දැක්වීම සිදු කෙරිණි.

(7) අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් සාක්ෂාත් කරගත හැකි නීති රාමුවක් සහ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.

I. ආයුර්වේද නීති සංග්‍රහය සකස් කර නීති සම්පාදක වෙත ඉදිරිපත් කිරීම, හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමට අදාළ රෙගුලාසි කෙටුම්පත් කිරීම, පෞද්ගලික ආයුර්වේද අරෝග්‍ය ශාලා හා බෙහෙත් ශාලා ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණ හා නියාමන නියෝග කෙටුම්පත් කිරීම සිදු කර ඇත.

II. ජාතික දේශීය වෛද්‍ය සභාවක් හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවක් පිහිටුවීම හා දේශීය වෙද මහතුන්, දේශීය වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සැකසීම සඳහා **"ජාතික දේශීය වෛද්‍ය සභාවක් පිහිටුවීම"** සම්බන්ධ කමිටුවක් ප්‍රකාශයට පත් කොට ඇත. දැනට එම කමිටුව විසින් ඒ පිළිබඳව මහජන අදහස් ලබාගෙන එම අදහස් විශ්ලේෂණය කරමින් පවතී.

(8) ආයුර්වේද උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම

වර්ෂිකව උපාධිධාරීන් 400ක් පමණ මෙම ක්ෂේත්‍රයට එක්වන අතර 2021 වර්ෂය වන විට ආයුර්වේද, සිද්ධ, යුනානි වෛද්‍ය උපාධි ලබා 1000කට ආසන්න සංඛ්‍යාවක් රැකියා විරහිතව සිටි අතර එයින් 157දෙනෙකුට වෛද්‍ය පත්වීම් ලබා දීමට හැකිවුණි.

(9) සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නියාමනය

වඩාත් ආරක්ෂිත, ගුණාත්මක හා මිත්‍රශීලි දේශීය වෛද්‍ය සේවාවක් ලබා දීමට සහ ආයුර්වේද නාමය යොදාගෙන පවත්වාගෙන යන නීත්‍යානුකූල නොවන ආයතන බිහිවීම වැළැක්වීම මූලික අරමුණු කර ගෙන පෞද්ගලික ආයුර්වේද ආරෝග්‍යශාලා, බෙහෙත්ශාලා සහ ආයුර්වේද ආයතන අධීක්ෂණය හා නියාමන කටයුතු සිදු කරන ලදී. ඒ අනුව මෙම වර්ෂය තුළපහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

i. ආයුර්වේද ආයතන ලියාපදිංචි කිරීම් - **607**

ii. ආයුර්වේද ආයතනවෙත බලපත්‍ර නිකුත් කිරීම - **1310**

iii. ආයුර්වේද නියාමන කමිටු පැවැත්වීම - **59**

iv. ආරෝග්‍යශාලා මණ්ඩලය මඟින් ආයුර්වේද ශාස්ත්‍රී පරීක්ෂණ පැවැත්වීමට ප්‍රථම විධිමත් පුහුණුවක් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් ලබාදීම.

(10) නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ ලබා දීම

පළාත් පාලන ආයතන යටතේ පවත්නා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා අවශ්‍ය ඖෂධ ලබා දීමට රු.මි.75ක් වෙන් වූ අතර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මඟින් ඖෂධ ලබා දීමට එම මුදල් යොදවා ඇත.

(11) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ

පාරම්පරික වෛද්‍ය ක්‍රම ඇතුළු දේශීය වෛද්‍ය ක්‍රම ගුණාත්මකව හා තිරසාරව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ සිදු කිරීම සහ ඒවා භාවිතයට ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව සාහිත්‍ය පර්යේෂණ 02ක්, උද්භිද විද්‍යා පර්යේෂණ 07ක්, ප්‍රමිතිකරණ පර්යේෂණ 03ක් හා සායනික පර්යේෂණ 07ක් සිදු කරමින් පවතී.

(12) සංරක්ෂණ සහා සවි බල ගැන්වීම

2011 ඔක්තෝබර් මස 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව හෙළ වෙද ගෙදර ව්‍යාපෘතිය වෙනුවට දේශීය වෛද්‍ය ක්‍රමය නඟා සිටුවීමට ක්‍රියාත්මක කළ හැකි වෙනත් විකල්ප යෝජනාවක් ලෙස ආයුර්වේද සංරක්ෂණ සහා සවි බල ගැන්වීම ආරම්භ කර ඇත.

2021 වර්ෂයේදී පළාත් 09 සඳහා ආයුර්වේද සංරක්ෂණ සහා වෛද්‍යවරුන් ලියාපදිංචිවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.537,869.00ක්ද, සුවධරණී කැපකරු වෛද්‍ය සේවා වැඩසටහනට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය රැගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට රු.2,900,000.00ක්ද, ආයුර්වේද සංරක්ෂණ සහා සඳහා පුස්තකාල පහසුකම් ලබා දීමට රු.308,000.00ක්ද, ඖෂධ නිෂ්පාදන උපකරණ ලබා දීම සඳහා රු. 200,880.00ක මුදලක්ද වැය කර ඇත.

හෝමියෝපති වෛද්‍ය සහාව

I රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය

දැනට හෝමියෝපති සායන 13ක් ක්‍රියාත්මක ඇති අතර 2021 වර්ෂයේදී රෝගීන් 43615ක් එමගින් ප්‍රතිකාර ලබා ඇත.

II හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම

කොවිඩ් 19 රෝග තත්ත්වය මත මහජනයා එක් රැස් කිරීම නුසුදුසු වූ බැවින් අමාත්‍යාංශයේ ඉල්ලීම මත 2021 මාර්තු 08 කාන්තා දිනයට සමගාමීව හා හෝමියෝපති වෛද්‍ය සහාවේ මෙහෙයවීමෙන් පහත සඳහන් ජංගම සායන පවත්වන ලදී.

අනු අංකය	මෙහෙයවීම	ස්ථානය හා දිනය	වැඩසටහන
01	තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය	සායන පරිශ්‍රය 2021.02.06	සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන හා රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා හැරීම
02	මාතලේ රජයේ හෝමියෝපති සායනය	සායන පරිශ්‍රය 2021.02.10	සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන හා රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා හැරීම

අනු අංකය	මෙහෙයවීම	ස්ථානය හා දිනය	වැඩසටහන
03	ඉංගිරිය රජයේ හෝමියෝපති සායනය	සායන පරිශ්‍රය 2021.02.11	සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන, රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා හැරීම, ප්‍රාදේශීය ලේකම් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම හා පැළ රෝපණය කිරීම
04	කුරුණෑගල රජයේ හෝමියෝපති සායනය	සායන පරිශ්‍රය 2021.02.05	සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන, රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා හැරීම හා දැනුවත් කිරීම්, එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා එක්ව ඔසු පැළ රෝපණය කිරීම හා තෝරා ගත් පවුල් කීපයක් වෙත ඔෂු පැළ බෙදා හැරීම
05	අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලද ජංගම සායනය	ගණේමුල්ල සිරිමහින්දාරාමය 2021.12.24	ලේ දන්දීමේ වැඩසටහනක් හා ඊට සමගාමීව හෝමියෝපති ජංගම සායනයක් පවත්වන ලදී.

III.හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හඳුන්වාදීම හා ප්‍රවර්ධනය සඳහා වූ මාධ්‍ය වැඩසටහන්

ඉසිවර පුවත්පත සඳහා දෙහිවල රජයේ හෝමියෝපති සායනය මඟින් ලිපි 05ක් ද, දිවයින පුවත්පත සඳහා ලිපි 06ක්ද, නවලිය පුවත්පත සඳහා ලිපි 02ක්ද, සිරිකත පුවත්පතේ ලිපි 06ක්ද පළකර ඇත. ස්වර්ණවාහිනී වැඩසටහන් 02ක්ද, සියත ටී.වී. වැඩසටහන් 12ක්ද මඟින් ජනතාව දැනුවත් කර ඇත.

(IV) හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

මෙම වර්ෂයේදී හෝමියෝපති උපාධිධාරීන් 05 දෙනෙකු වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමත් සමඟ මෙරට ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 308ක් දක්වා වර්ධනය වී ඇත.

(V) නව වෛද්‍යවරුන් බඳවා ගැනීම

හෝමියෝපති උපාධිධාරීන් තිදෙනෙකු වෛද්‍යවරුන් ලෙස හෝමියෝපති සායන සඳහා බඳවා ගෙන ඇත.

(VI) නව සායන ආරම්භ කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය යටතේ නව සායනයක් 2021.07.13 දින ආරම්භ කරන ලදී.

(VII) හෝමියෝපති බෙහෙත් ආනයනය සඳහා නිර්දේශ ලබා දීම

හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා වෛද්‍යවරුන් සහ ආයතන 16ක් වෙත ඇමරිකානු ඩොලර් 145,846.89ක් සහ ඉන්දියානු රුපියල් 155,092.00 වටිනා ආනයන බලපත්‍ර 17ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

හෝමියෝපති රෝහල

(1) 2021 වසරේ සේවා ලබා දුන් රෝගීන් සංඛ්‍යාව

2021 වර්ෂය තුළ හෝමියෝපති රෝහල කොවිඩ්-19 ප්‍රතිකාරක මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතා වූ බැවින් අභ්‍යන්තර රෝගී ප්‍රතිකාර සේවා තාවකාලිකව නවත්වා තිබුණි. බාහිර රෝගී අංශයෙන් රෝගීන් 14,754ක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

(ii) ඉදි කිරීම් හා යටිතල පහසුකම්

බාහිර රෝගී අංශය අළුත්වැඩියාව, ජල ටැංකිය ඉදි කිරීම, රෝහල් ගේට්ටුව අළුත්වැඩියාව, රෝහල් පිවිසුම් මාර්ගය හා නව ජල සම්බන්ධතාවයක් සැකසීම 2021 වසර තුළ සිදුකර ඇත.

(iii) හෝමියෝපති ඖෂධ

රජයේ හෝමියෝපති සායන සඳහා බෙදා හැරීමට රු. මිලියන 4.429ක වටිනාකමකින් යුත් ඖෂධ රාජ්‍ය ඖෂධ සංස්ථාව මඟින් ආනයනය කර වැලිසර රජයේ හෝමියෝපති රෝහලට ලබා දෙන ලදී.

(IV) හෝමියෝපති වෛද්‍ය ශිෂ්‍යත්ව

හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය විසින් කල්කටාවේ ජාතික හෝමියෝපති ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා වාර්ෂික ශිෂ්‍යත්ව 10ක් පිරිනමනු ලැබීය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

(i) නව නිෂ්පාදන හඳුන්වා දීම

2021.03.26 දින බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණියගේ සහ දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ලද ඖෂධීය ගුණයෙන් යුත් බුලත් විටක් **"බුලත් සැපේ"** නාමයෙන් වෙළඳපලට හඳුන්වා දෙන ලදී.

සංස්ථා නිෂ්පාදන වන පස්පංගුව, පේයාව, නිල්මා තෙලය, නෙල්ලි රසකිඳ පානය සහ රක්ත චන්දන් මුහුණ ශෝධනය සඳහා 2021 වර්ෂයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටු අනුමැතිය ලබා ගැනීමට ද හැකි විය.

(ii) සංවර්ධන කටයුතු

600 Liters Stainless Steel Cosmetics Mixing Machine.

නව නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා මෙම යන්ත්‍රය 2021 වර්ෂයේ දී මිල දී ගත් අතර මෙමගින් එකවර වැඩපත් 05ක් පමණ පමණ අවම කාලයකින් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. මෙමගින් Wenivel Body Wash, Perfect Glow වැනි රූපලාවන්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය පෙරට වඩා කාර්යක්ෂමව සිදු කිරීමට හැකි වී ඇත.

(iii) ඔසු උයන් ප්‍රගතිය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මඟින් නිකවැරටිය, දංගොල්ල හා මැදවච්චිය යන ප්‍රදේශවල ඔසු උයන් පවත්වාගෙන යනු ලබයි.

නිකවැරටිය ඔසු උයන

අක්කර 50කින් යුත් නිකවැරටිය ඔසු උයනේ පූර්ණ වපසරිය ආවරණය වන අයුරින් වගා කිරීම සඳහා අවශ්‍ය දිර්ගකාලින ඔසු පැළ ඔසු උයන වෙත සපයා අවසන් කර ඇත. මෙහි දීර්ඝකාලීන බෝග ලෙස ඖෂධ පැල වර්ග 20ක් හා කෙටිකාලීන බෝග ලෙස ඖෂධ පැල වර්ග 03ක වගා කිරීම ආරම්භ කර ඇත. 2021 වසරේදී ඔසු අමුද්‍රව්‍ය නිෂ්පාදනය මගින් ලබා ඇති මුළු ආදායම රු : 2,810,350.27කි.

දංගොල්ල ඔසු උයන

අක්කර 35 කින් සමන්විත මෙම ඔසු උයනෙහි සංවර්ධන කටයුතු මේ වනවිට සිදුකරගෙන යන අතර අස්වනු නෙලීම ද සිදුකරනු ලබයි. දීර්ඝකාලීන බෝග ලෙස ඔසු වර්ග 15ක් හා කෙටිකාලීන බෝග ලෙස ඔසු වර්ග 08ක් වගා කර ඇත. 2021 වසරේදී ඔසු අමුද්‍රව්‍ය නිෂ්පාදනය මගින් ලබා ඇති මුළු ආදායම රු: 1,309,100.36 කි.

මැදවච්චිය ඔසු උයන

අක්කර 5.5 කින් සමන්විත මෙම ඔසු උයනෙහි සංවර්ධන කටයුතු මේ වනවිට සිදුකරගෙන යන අතර අස්වනු නෙලීම ද සිදුකරනු ඇත. දිගුකාලීන වගාවක් ලෙස පොල් වගා කර ඇත. 2021 වසරේදී ඔසු අමුද්‍රව්‍ය නිෂ්පාදනය මඟින් ලබා ඇති මුළු ආදායම රු:16,138.75 කි.

(iv) නව අලෙවි ශාඛා පිහිටුවීම

නාරාහේන්පිට "රජවාසල" අලෙවි සංකීර්ණය තුළ සංස්ථා නව අලෙවි ශාඛාවක් පිහිට වූ අතර ඇඹිලිපිටියේ පිහිට වූ නව අලෙවි මධ්‍යස්ථානය මඟින් වියළි ඖෂධ මිල දී ගැනීම ද සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ අලෙවිය වැඩිකර ගැනීමේ අරමුණින් අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුළ ආයුර්වේද ඖෂධ පිළිබඳ සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළු දිවයින පුරා සිදුකෙරිණි.

අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය - අමාත්‍යාංශ කාර්යාලය

කාණ්ඩය/වැය විෂයය/අයිතමය	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)	වියදම් ප්‍රතිශතය (%)
පුනරාවර්තන	**331,700,000.00**	**316,062,725.75**	**95.29**
සාමාන්‍ය පරිපාලනය / වෙනත් වැඩසටහන්	284,500,000.00	270,353,879.29	95.03
ආයතන සේවා රාජ්‍ය ආයතන හෝමියෝපති වෛද්‍ය සභාව	25,400,000.00	24,448,700.92	96.25
හෝමියෝපති රෝහල	21,800,000.00	21,260,145.54	97.52
ප්‍රාග්ධන	**139,011,000.00**	**134,489,628.90**	**96.75**
සාමාන්‍ය පරිපාලනය	7,500,000.00	5,435,974.33	72.48
විශේෂ වැඩසටහන්			
• ආයුර්වේද ඖෂධ සංස්ථාව	23,500,000.00	23,500,000.00	100.00
• සංරක්ෂණ සභා	5,000,000.00	3,907,240.74	78.14
• හෝමියෝපති කවුන්සලය	2,000,000.00	1,792,690.70	89.63
• හෝමියෝපති ක්‍රම සංවර්ධනය	5,000,000.00	4,486,192.00	89.72
	5,000,000.00	4,848,632.58	96.97
• පෝෂණ මන්දිර ස්ථාපනය කිරීම	91,011,000.00	90,518,898.55	99.46
• කොවිඩ් -19 රෝගීන් සඳහා අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම			
මුළු එකතුව	**470,711,000.00**	**450,552,354.65**	**95.72**

රාජ්‍ය අමාත්‍ය කාර්යාලය

	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)	වියදම් ප්‍රතිශතය (%)
පුනරාවර්තන	32,125,642.63	28,826,570.32	89.73
ප්‍රාග්ධන	5,174,357.37	4,156,799.02	80.33
මුළු එකතුව	**37,300,000.00**	**32,983,369.34**	**88.43**

2.2 ඉදිරි ඉලක්ක

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය වඩා දියුණු මට්ටමට පත් කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය යොදා ගැනීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම.
4. "සුව ධරණී ජීවක සෙවණ" ව්‍යාපෘතිය යටතේ පාරම්පරික වෛද්‍යවරුන් ඊ-තාක්ෂණය ඔස්සේ ජනතාවට සමීප කරවීම.
5. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ මෙරට වගාකිරීම තුළින් වාර්ෂිකව රු. මී. 1000 ක් ඉතිරි කිරීම.
6. දේශීය වෙදකම් ප්‍රවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීම.
7. පාරම්පරික වෛද්‍යවරුන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම.
8. පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මගින් සුව කළ හැකි පහත සඳහන් විශේෂිත රෝග සඳහා පවතින ආයුර්වේද රෝහල් 7 ක් අංගසම්පූර්ණ විශේෂිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම (ආඝාත රෝගය / විශේෂිත ස්නායු රෝග, සන්ධි රෝග, අර්ශස් / භගන්දරා, භග්න (කැඩුම් බිඳුම්), අක්ෂි රෝග, දැවුම් පිලිස්සුම්, චර්ම රෝග).
9. වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
10. ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
11. අවම වශයෙන් පළාතකට එක් ගෙවන වාට්ටු පහසුකම් සහිත ආයුර්වේද රෝහලක් බැගින් ඇති කිරීම.
12. "හරිතකී" නගර ඔසු වන වැඩසටහන යටතේ ඔසු වන 500ක් බිහි කිරීම.
13. රටේ සංවර්ධනය සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයෙන් ලබා දෙන දායකත්වය මැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
14. දිස්ත්‍රික්කයකට අවම වශයෙන් එක් හෝමියෝපති සායනයක් බැගින් ඇති කර ජනතාව තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
15. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
16. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මගින් ලබා දෙන සේවා හා නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
17. අන්තර් ජාතික මට්ටමේ සමුළුවක් හා ප්‍රදර්ශණයක් පැවැත්වීම.

2.3 අභියෝග

1. ආයුර්වේද රෝහල් සඳහා ප්‍රමාණවත් හෙද කාර්ය මණ්ඩලයක් නොලැබීම.

2. ආයුර්වේද ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොවීම.

3. ආයුර්වේද ක්ෂේත්‍රයෙන් සෞඛ්‍ය අංශයට සිදුවන දායකත්වය පිලිබිඹු නොවීම.

4. අමාත්‍යාංශය සඳහා කාර්යාලීය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම.

5. රථවාහන නවතා තැබීමේ පහසුකම් අවම මට්ටමක පැවතීම.

.....

ගණන් දීමේ/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

කුමාරි වීරසේකර
ලේකම්
දේශීය වෙදකම් ප්‍රවර්ධන
ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ
ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය.
අංකය 26, 3 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

3. පරිච්ඡේදය

03. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසිඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තක්සේ 2021 රු.	තක්සේ නැවත ගලපන ලද 2,020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		345,667,000	102,449,994	ඒසිඒ-3
-	තැන්පතු		187,595	912,918	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		9,528,077	1,979,943	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**355,382,672**	105,342,855	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**355,382,672**	105,342,855	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		2,931,557	158,078	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		352,451,115	105,184,777	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
198,150,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	186,550,377	63,307,432	
139,387,025	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	133,103,961	59,899,985	ඒසිඒ-2(ii)
26,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	24,946,340	8,101,274	
-	පොළී ගෙවීම්	8	-	-	
288,618	වෙනත් පුනරාවර්තන වියදම්	9	288,618	-	
363,825,643	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**344,889,296**	131,308,691	
	මූලධන වියදම්				
9,174,357	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,600,575	3,357,533	
11,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	10,867,119	5,446,046	
31,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	30,159,835	7,525,234	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	500,000	2,500	
-	වෙනත් මූලධන වියදම්	15	-	464,076	
53,174,357	**මුළු මූලධන වියදම් (උ)**		**48,127,529**	16,795,389	
	තැන්පතු ගෙවීම්		216,111	871,702	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		9,879,283	27,660,852	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**10,095,394**	28,532,554	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**403,112,219**	176,636,634	
417,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(50,661,104)	(71,451,857)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(50,661,104)**	(71,451,857)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසිඒ-3
			-	-	

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	221,664,728	217,344,162
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	26,033,365	25,680,909
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**247,698,093**	**243,025,071**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		26,020,665	25,639,693
දේපළ පිරියත හා උපකරණ සංචිතය		221,664,728	217,344,162
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	12,700	41,216
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**247,698,093**	**243,025,071**

පිටු අංක 7 සිට 62 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 63 සිට 78 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2022/02/24	දිනය : 2022 02 22	දිනය : 2022.02.22.
වෛද්‍ය එස්. එච්. මුණසිංහ ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය [illegible]	කුමාරි විරසේකර ලේකම් දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය. අංක: 26, 3 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.	එස්.ඇයි.සී. තුෂාරිකා ප්‍රධාන ගණකාධිකාරී දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය. අංක: 26, 3 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ නැවත ගලපන ලද 2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	4,231,143	4,374,410
අග්‍රිම ලැබීම්	345,667,000	102,449,994
අත්තිකාරම් අයකර ගැනීම්	3,394,004	1,841,673
තැන්පතු ලැබීම්	187,595	893,410
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**353,479,742**	**109,559,487**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	190,485,622	86,959,821
සහනාධාර සහ මාරුකිරීම්	24,711,629	8,091,274
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	89,750,132	291,136
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,931,557	158,078
අත්තිකාරම් ගෙවීම්	7,331,184	5,030,000
තැන්පතු ගෙවීම්	216,111	871,702
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**315,426,235**	**101,402,011**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**38,053,506**	**8,157,476**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	38,053,506	8,157,476
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**38,053,506**	**8,157,476**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(38,053,506)**	**(8,157,476)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් - නැත

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය – අදාළ නොවේ

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	**වෙන් කරන ලද ප්‍රතිපාදන**		**තත්‍ය වියදම**	**% ක් ලෙස**
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	364,000,000	363,825,643	344,889,296	94.80%
ප්‍රාග්ධන	53,000,000	53,174,357	48,127,530	90.51%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	**කේත විස්තරය**	**2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තා අනුව ශේෂය**
9151	ගොඩනැගිලි	144,000.00
9152	යන්ත්‍රෝපකරණ	221,520,727.54

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MED/A/ISM/FA/21/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 31 දින

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය.

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
ශීර්ෂය 416 - දේශීය වෛද්‍ය කර්මී ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය- 2020 154(6) වාර්තාව		
(අ) 2.5 ඡේදය	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙනයනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) 3.1 ඡේදය	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ) 3.2 ඡේදය	විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුව තුළ වාහනවල පිරිවැය සඳහන්ව නොතිබුණු අතර එම ලැයිස්තුවේ ඇතුළත්ව තිබුණු මෝටර් බයිසිකල් 48 ක, අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 ක පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය සතු සියලුම වාහනවල පිරිවැය ගිණුම්ගත කළ යුතුය

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණු සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලේ ජල හා විදුලි බිල්පත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගෙවීම් කරන බැවින්, ඒ සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා නොගත යුතු නමුත් ඒ වෙනුවෙන් රු.3,000,000 ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඉන් රු.2,500,000 ක් ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැය විෂයය වෙත මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 ජූලි 06 දින මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු කාර්යාල උපකරණවල පිරිවැය රු.2,767,510 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර ඒවා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරද නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ සතු වාහන සංඛ්‍යාව 29 ක් වන බවත්, ඒවායේ පිරිවැය රු.205,579,850 ක් වන බවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණද, එදිනට අමාත්‍යාංශ සතු වාහන සංඛ්‍යාව 17 ක් බවත්, ඒවායේ පිරිවැය රු.154,225,000 ක් බවත්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණි. තවද, ඉකුත් වර්ෂයේ විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුවේ ඇතුළත්ව තිබුණු ඔසුගොවි ව්‍යාපෘතියට අයත්ව තිබුණු මෝටර් බයිසිකල් 48 ක සහ අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 ක පිරිවැය සමාලෝචිත වර්ෂයේදීද ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ පාලනය වන හෝමියෝපති රෝහලේ මූලධන වියදම් සඳහා රු.1,568,360 ක් වැය කර අදාළ වැය විෂයයට හරකර තිබුණි. එසේ වුවද, රෝහලේ නාමපුවරු සඳහා වැය කර තිබුණු රු.144,000 ක් පමණක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණු නමුත්, ඉතිරි රු.1,424,360 මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි (4) 447 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 4 කට අදාළ රු.3,650,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන් වෙත මාරු කර ගෙන තිබුණු බැවින්ද, අමාත්‍ය කාර්යාලයේ පැරණි යන්ත්‍රෝපකරණ නොතිබුණු නමුත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු සඳහා රු.850,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු බැවින් ඉන් සියයට 71 ක් හෙවත් රු.600,000 ක් අමාත්‍යවරයාගේ වාහන නඩත්තු වියදම් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබුණු බැවින්ද, මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නහවුරු විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94 (1) හි දැක්වෙන විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.103,264 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.212,290 ක බැරකම් වලට බැඳී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 05 කට අදාළ රු.169,833 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති, විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම
(අ) ජාතික විගණන පනත 40 වන වගන්තිය	අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 (ඇ)	ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණු මාස 06 ඉක්ම වූ රු.20,225 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි.
(ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

2.4 අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 427(1) ප්‍රකාරව පිළියෙල කර තිබුණු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සැසඳුම් ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර තිබුණු මුළු ණය රු.7,336,409 ක්වූ නමුත් මුදල් රෙගුලාසි 506 (ඩී) ප්‍රකාරව පිළියෙල කර තිබුණු සැසඳුම් ප්‍රකාශයෙහි එය රු.33,017,318 ක් ලෙස වරදවා දක්වා තිබුණි.

(ආ) සේවය අතහැර ගොස්, වර්ෂ 02 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.171,975 ක්ද, වර්ෂ 03 ත් වර්ෂ 04 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.121,120 ක්ද වශයෙන් වූ එකතුව රු.293,095 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාව පුරා ආරණ්‍ය 565 ක භික්ෂූන් වහන්සේලාට සුවධරණී කැපකරු වෛද්‍ය සේවා සැපයීමට ආරම්භ කළ ව්‍යාපෘතියක කැපකරු වෛද්‍යවරුන් ලෙස පත්කිරීමට අපේක්ෂිත පාරම්පරික වෛද්‍යවරුන් වෙත ලබාදීම සඳහා රු.2,900,000 ක් වැයකර ඖෂධ රැගෙන යන ගමන් මළු 1,000 ක් මිලදී ගෙන තිබුණි. ආරණ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පත්කළ හැකි උපරිම කැපකරු වෛද්‍යවරුන් සංඛ්‍යාව 565 ක් වන බැවින් වැඩිපුර ගමන් මළු 435 ක් මිලදී ගැනීම සඳහා රු.1,261,500 ක් වැය කර තිබුණු අතර එය නිෂ්කාර්ය වියදමක් වන බව නිරීක්ෂණය විය. තවද, 2022 අප්‍රේල් 08 දින වන විටත් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක පාරම්පරික වෛද්‍යවරුන් 105 දෙනෙකුට පමණක් ගමන් මළු බෙදාදී තිබුණු බවත්, එදිනට ගමන් මළු 895 ක් ඉතිරිවී තිබුණු බවත්, කැළණිය රජමහා විහාරයේදී පවත්වා තිබුණු බෙදාහැරීමේ උත්සවය සඳහා රු.221,300 ක් වැයකර තිබුණු බවත්, ගමන් මළු 1,000 මිලදී ගැනීම සහ ඒවා නිකුත් කිරීම පිළිබඳ දත්ත හා තොරතුරු තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) දිස්ත්‍රික්ක 09 ක ආයුර්වේද සංරක්ෂක සහා සඳහා පුස්තකාල පොත් ලබාදීමට රු.255,000 ක් වැයකර තිබුණු අතර ඉන් සියයට 42 කටත් වඩා වැඩියෙන් ගම්පහ දිස්ත්‍රික්කයට ලබාදීමට කටයුතු කර තිබුණි.

(ඇ) මහජනතාව තුළ ගුණාත්මක බවින් පිරිසුන් සෞඛ්‍යාරක්ෂිත දේශීය ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා බෝ නොවන රෝගවලින් ජනතාව මුදාගැනීමේ අරමුණින් පෝෂදායී දේශීය ආහාර අලෙවි කිරීම සඳහා දිවයින පුරා පෝෂණ මන්දිර අලෙවිහල් ස්ථාපිත කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.1,800,000 ක හා රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව එම වර්ෂ දෙක තුළදී පිළිවෙලින් රු.1,676,763 ක් හා රු.4,848,633 ක් වශයෙන් එකතුව රු.6,525,396 ක් ඒ වෙනුවෙන් වැයකර තිබුණු අතර ඉන් රු.5,000,000 ක් හෙවත් සියයට 77 ක්ම ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් වැයකර තිබුණි.

3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද ඖෂධ සංස්ථාව තුළ ඩීසල් ජෙනරේටර් යන්ත්‍රයක් හා නව විදුලි බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.5,000,000 ක් හා රු.23,500,000 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් එම සංස්ථාව වෙත ලබාදී තිබුණු නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් සංස්ථාව විසින් එම මුදල් අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර ඒ වෙනුවට ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි.

(ආ) කැපකරු වෛද්‍යවරුන්ගේ සේවය ඇගයීමේ සහතිකපත් 500 ක් මුද්‍රණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.32,500 ක් වැයකර තිබුණු නමුත් 2022 අප්‍රේල් 08 දින වන විටත් එම සහතිකපත් බෙදාදී නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 403 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 345 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 14 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 58 ක් විය. එම පුරප්පාඩු පැවතීම තුළින් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධන ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි බලපෑමක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු කම්කරු තනතුරක් සඳහා 2010 ඔක්තෝබර් මාසයේ සිට විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පදනම් මත සේවකයෙකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් තනතුර අනුමතව නොතිබුණි.

(ඇ) 2019 මැයි 15 දින සිට පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතියද. එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා නොගෙන 2020 නොවැම්බර් 09 සිට කොන්ත්‍රාත් පදනම්මත විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි.

අයි. සමරගේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4. **පරිච්ඡේදය**

04. කාර්ය සාධන දර්ශක

- දේශීය වෛද්‍ය සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය
- ගුණාත්මක ඔසු අමු ද්‍රව්‍ය හා ගුණාත්මක ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය
- සෞඛ්‍ය සම්පන්න පෝෂණ මට්ටමේ කාර්ය සාධනය
- පාර්ම්පරික වෛද්‍ය ක්‍රම හා වෛද්‍ය දැනුම සංරක්ෂණය වීම
- පර්යේෂණ අවස්ථා වර්ධනය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ගත් විට ඒ මඟින් කරන කාර්ය භාරය තුළින් සිදු වනුයේ රටේ සෞඛ්‍ය සේවාවේ ගුණාත්මක වර්ධනයකි. ජනතාවගේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදු වන වර්ධනයක් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයෙන් ආවරණය වන්නේ කොපමණද? බටහිර හා වෙනත් වෛකල්පික වෛද්‍ය ක්‍රම වලින් සිදු වන දායකත්වය කොපමණද යන්න වෙන් කර හඳුනා ගැනීමට ඉතාමත් අපහසු කාර්යයකි.

5. පරිච්ඡේදය

05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සෘජුවම වෙන් කර සකස් කර නොමැති බැවින් සමස්ත සෞඛය සේවාව සඳහාම වන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයටද අදාළ කර ගෙන කටයුතු කළ යුතුව ඇත. එබැවින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ගත් විට තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව සෘජුවම කරුණු දැක්වීම අපහසු වී ඇත.

අනු අංකය	ඉලක්ක/පරමාර්ථ (යෝජිත ඉලක්ක)	දර්ශක
01	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	හෘද වාහිනී රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත ශ්වසන රෝග හේතුවෙන් වන මරණ අනුපාතය සියදිවි නසා ගැනීමේ මරණ අනුපාතය
02	හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ආබාධ සඳහා ප්‍රතිකාර මැදිහත්වීම (ඖෂධීය, මනෝ සමාජීය හා පුනරුත්ථාපන හා පසු සේවා)
03	මූල්‍ය අවදානමට පත්වීම සඳහා ආරක්ෂණයද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබාගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලුදෙනාටම ලබාගත හැකිවීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකිවීම.	අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් ආවරණය කිරීම (ප්‍රජනක, මාතෘ, අලුත උපන් හා ළමා සෞඛ්‍ය, බෝ වන රෝග, බෝ නොවන රෝග සහ සේවා ධාරිතාව සහ ප්‍රවේශය ඇතුළු පොදු සහ සාමාන්‍ය අතර විමර්ශක මැදිහත්වීම් මත පදනම් වූ අත්‍යවශය සේවාවන්හි සාමාන්‍ය ආවරණය ලෙස අර්ථ දැක්වේ. වඩාත්ම අවාසි සහගත ජනගහනය)

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අභියෝග

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට අදාළව දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ කාර්ය භාරය ඉටු කළද සපුරා ගැනීම බටහිර සෞඛ්‍ය අංශයෙන් සිදු කරන කාර්ය භාරයෙන් වෙන් කර දැක්වීම අපහසු වේ.

6 පරිච්ඡේදය

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/**අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	16	12	04
තෘතියික	03	02	01
ද්විතීයික	366	285	81
ප්‍රාථමික	18	14	04

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

ආයතනයේ පවතින පුරප්පාඩු දෛනික රාජකාරි ඉටු කිරීමට දැඩි බාධාවක් වී ඇත. නිලධාරීන් කාර්ය බහුලවීම නිසා කායික හා මානසික පීඩාවන්ට පත්වීම හේතුවෙන් සේවක කාර්යක්ෂමතාවය අඩු වීමට එය හේතු වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු වැඩසටහන්

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කාලය	ආයතනය	සහභාගී වූ නිලධාරීන්
01	කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන	දින 03	වයඹ පළාත් කලමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය	සංවර්ධන නිලධාරී, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්
02	කාර්යාල ලිපි ලේඛන හා ලිපි ගොනු කළමනාකරණය	දින 01	ජාතික වැවිලි කර්මාන්ත ආයතනය (NIPM)	සංවර්ධන නිලධාරී, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී
03	රාජකාරි ලිපි සැකසීමේදී අනුගමනය කළ යුතු උපදෙස්	දින 01	ජාතික වැවිලි කර්මාන්ත ආයතනය (NIPM)	මාණ්ඩලික නිලධාරීන්, සංවර්ධන නිලධාරී, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී,
04	රාජකාරි කටයතු සඳහා ලේඛනගත තැපැල කළමනාකරණයේදී පිළිපැදිය යුතු මූලික රීති	දින 01	ජාතික වැවිලි කර්මාන්ත ආයතනය (NIPM)	සංවර්ධන නිලධාරී, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී

අනු අංකය	**පුහුණු වැඩසටහන**	**පුහුණු කාලය**	**ආයතනය**	**සහභාගී වූ නිලධාරීන්**
05	කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන	දින 02	ජාතික පර්යේෂණ ඔසු උයන - හල්දුම්මුල්ල	සංවර්ධන නිලධාරී, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී, කාර්යාල කාර්ය සහායකයින්, රියදුරන්
06	විනය ක්‍රියා පටිපාටිය පිළිබඳව දැනුවත් කිරීම	දින 01	ජාතික වැවිලි කර්මාන්ත ආයතනය (NIPM)	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී
07	රජයේ වාහන නඩත්තුව	දින 01	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	ප්‍රවාහන නිලධාරී
08	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	දින 02	ශ්‍රී ලංකා පදනම් ආයතනය	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, උපාධිධාරී අභ්‍යාසලාභී
09	රාජ්‍ය ආයතන තුළ විනය කළමනාකරණය	දින 02	ශ්‍රී ලංකා පදනම් ආයතනය	නීති නිලධාරී

විදේශීය පුහුණු වැඩසටහන්

Name of the programme	Country	Period	Officers
Traditional AYUSH Medicine Systems Of India	India	8th November -19th November 2021	16
Training course on Tuina & Acupunture for developing countries (Online)	China	17th November -16th December 2021	35
Seminar on Traditional Chinese Medicine Application and Vaccine Cooperation of Fighting Against COVID -19 for South Asian Countries"	China	16th November – 29th November 2021	6
Training Course for community level medical personals of developing countries	China	29th November – 19th December 2021	10
Seminar on Hospital Management and Operation for Developing Countries (Online)	China	21st December -30th December 2021	14

7. පරිච්ඡේදය

07. අනුකූලතා වාර්තාව

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහහරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ නම්				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.6	වෙනත්	අදාළ නොවේ.		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රේ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩි නඩි ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බල තල පවරා තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බල තල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනුති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (**NBD**) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාෂය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම**			
5.1	විගණාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම.	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	**DMA** චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු	2021 වර්ෂය සඳහා 02ක්		

	04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	පවත්වා ඇත.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/ 2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	නැත		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම		අපහරණයට වාහන නැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වානෙ යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ.	කල් බදු ක්‍රම වාහන ලබාගෙන නැත.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර එවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාෂ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**	අනුකූල වේ.		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	පොදු තැන්පත් ගිණුම්	අනුකූල වේ.		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ.		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	ආදායම් නොමැත.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම්ට බැර කර තිබීම	අනුකූල වේ.		

15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිත්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකාරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීව කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දුන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/ 2008 හා 05/ 2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	දැනට සකස් කරමින් පවතී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රම වේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	දැනට සකස් කරමින් පවතී.	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/ 2018 ඇමණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	**නැත.**		

19.4	ඉහත සඳහන් චක්‍රලේඛනයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්ෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		